# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,937 — 1970 දෙසැම්බර් 18 වැනි සිකුරාද — 1970.12.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම සංග්‍රහකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් කාණ්ඩයට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 939 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 940 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... | 941 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | 942 |
| ආණ්ඩුවේ නිවේදන ... | 942 |
| මිළ පාලන දැන්වීම් ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 947 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 406

අංකය: ඩීජී 17/ආර්ජීසී (II).

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත් කිරීම් අත්හැර යාම් සහ පත්කිරීම්

#### පත් කිරීම් අත්හැර යාම

යුද්ධ හමුදා පනතේ (357 වන අධිකාරය) 13 (1) වන වගන්තිය යටතේ පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් පෙන්වා ඇති දිනයන්හි සිට ආධුනිකයින් බඳවන නිලධාරි තනතුර අත් හරින ලදී :—

කපිතාන් චූලාශෝක ලක්ෂ්මන් අල්ගම, ගැ.හේ.බ.—1970 ඔක්තෝබර් 20 වැනි දින.

කපිතාන් හපු ආරච්චිගේ සෝමදාස, ල.සි.රෙ.—1970 සැප්තැම්බර් 1 වැනි දින.

කපිතාන් හේරත් මුදියන්සේලාගේ කරුණාරත්න, ගැ.හේ.බ.—1970 නොවැම්බර් 1 වැනි දින.

#### පත් කිරීම්

යුද්ධ හමුදා පනතේ (357 වන අධිකාරය) 13 (1) වන වගන්තිය යටතේ පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් පෙන්වා ඇති දිනයන්හි සිට ආධුනිකයින් බඳවන නිලධාරීන් වශයෙන් :—

කපිතාන් මොහමඩ් සඉජ් මොහමඩ් කලීම්, ගැ.හේ.බ.—1970 ඔක්තෝබර් 20 වැනි දින.

ලුතිනන් ගැමුණු පැරකුම් කුලතුංග, ල.සි.රෙ—1970 සැප්තැම්බර් 1 වැනි දින.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 දෙසැම්බර් 3 වැනි දින,
කොළඹදිය.

12-561

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1970 ජනි 2 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

1970 අංක 407

අංකය : ඩී.ජී. 250/ආර්ඊසීඊ./2 (II)

## යුද්ධ හමුදුව—ස්ථිර බල හමුදුව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියේ සඳහන් කර ඇති දිනයන්හි සිට කපිතාන්වරුන් වශයෙන් :—

ලුතිනන් රොයි චන්ද්‍රා තිසේරා, ල. ඉ.—1970 ජූනි 1 වැනි දින සිට.
ලුතිනන් නිල් සූරිය බණ්ඩා දෙල්ගොඩ, ල. ස. බ.—1970 මාර්තු 1 වැනි දින සිට.

ලුතිනන් වඩුතන්තිරිගේ ඩෙරික් ගිල්පඩ් ද සිල්වා, ල. ඉ.—1970 මාර්තු 1 වැනි දින සිට.

පහත නම් සඳහන් නිලධාරීන් 1970 ජූනි 16 වැනි දින සිට කපිතාන්වරුන් වශයෙන් :—

ලුතිනන් අශෝක කාන්තිලාල් ජයවර්ධන, ල. පා. හ.

ලුතිනන් එඩ්වර්ඩ් හේමසිරි සමරතුංග, ල. ඉ.

ලුතිනන් වෙදමේස්ත්‍රිගේ මහින්ද පැට්‍රික් ප්‍රනාන්දු, ගැ. හේ. බ.

ලුතිනන් සතිස්චන්ද්‍ර විකිරිබංඩා තෙන්නකෝන් ජයසුන්දර, ල. ස. ස. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 දෙසැම්බර් 7 දින,
කොළඹ දී ය.

12-669

---

1970 අංක 408

අංකය : සීඑච්/වීඑජ්/34 (බී).

## යුද්ධ හමුදුව—ලංකා ස්වෙච්ඡා බල සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම් සඳහන් නිලධාරියා 1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට ලංකා ස්වෙච්ඡා බල සේනාවෙන් විශ්‍රාම ගෙන ඇත :—

කපිතාන් අබ්බි නාසසිංගම් රත්නාතිකම්, ල. යු. ප්‍ර. බ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 දෙසැම්බර් 4 දින,
කොළඹදී ය.

12—670

---

1970 අංක 409

අංකය : සීඑච්/වීඑජ්/2/ඒ.

## යුද්ධ හමුදුව—ලංකා ස්වෙච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීමක් හා ඇතුලත් කිරීමක්

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට පහත නම සඳහන් බලලත් නිලධාරියා, යුද්ධ හමුදාවේ ස්වෙච්ඡා බලසේනාවේ ලුතිනන් (උපකරණ පාලක) වශයෙන් අධිකාරියට පත්කිරීම සහ ඔහුව 2 (ස්වෙච්ඡා) බලඇණිය, ලංකා පාබල හමුදුවට ඇතුලත් කිරීම උතුමාණන් වහන්සේ විසින් සතුටින් අනුමත කරන ලදී.

11270 බලලත් නිලධාරි 1 කුරුකුලසූරිය ජෝන් පෝල් පීරිස්.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 දෙසැම්බර් මස 3 වැනි දින,
කොළඹදීය.

12-585

1970 අංක 410

අංකය : ජීජී 22/ආර්ඊසීඊ/188.

## රාජකීය ලංකා නාවික හමුදුව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම් සඳහන් නිලධාරියා 1970 දෙසැම්බර් මස 1 වැනි දින සිට රාජකීය ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික බලකායෙන් විශ්‍රාම ගෙන ඇත.

කොමාන්ඩර් ඩී. සී. ඉංගල්ටන්, රා.ලං.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 දෙසැම්බර් 8 දින,
කොළඹ දීය.

12-639

---

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 411

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්වීම් නියෝග කර ඇත :—

ඒ. 100/70.

අධිනීතිඥ එම්. සන්මුගනාදන් මහතා, 1970 නොවැම්බර් මස 2 වැනි දින සිට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ස්ථිර ලේකම් වශයෙන්.

ඒබී. 89/70.

තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් සී. ජේ. සේරසිංහ මහතා, සිය රාජකාරිවලට අමතරව, 1970 නොවැම්බර් මස 1 වැනි දින සිට පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ තනතුරෙහි වැඩ බැලීමට.

ඒබී. 115/70.

කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අගය මැනීම) ආර්. භුවනේන්ද්‍රම් මහතා 1970 නොවැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ වැඩ සටහන් සම්පාදක අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ඒ. 34/68.

ලංකා පරිපාලන සේවයේ ක්‍රිස්ටි සිල්වා මහතා 1970 සැප්තැම්බර් මස 20 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පුත්තලම පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 66/70.

ලංකා පරිපාලන සේවයේ එස්. එච්. එම්. ඉසෙඩ්. ෆාරුක් මහතා 1970 සැප්තැම්බර් මස 11 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම්, විවාහ, උප්පැන්න හා මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් ලෙස වැඩ බැලීමට.

ඒ. 59/70.

ලංකා පරිපාලන සේවයේ පී. ඒ. අබේවික්‍රම මහතා 1970 අගෝස්තු මස 8 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ජ්‍යෙෂ්ඨ සහකාර ධීවර අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 54/68.

ලංකා පරිපාලන සේවයේ එම්. බී. සී. සිල්වා මහතා 1970 අගෝස්තු මස 3 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ප්‍රවාහණ අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයකු ලෙස වැඩ බැලීමට.

ඒ. 2/70.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ I වැනි ශ්‍රේණියේ ජී. ඇම්. පතිරත්න මහතා 1970 ජූලි මස 22 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශයේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 57/70.

ලංකා පරිපාලන සේවයේ ඩබ්ලිව්. ඊ. වී. එස්. ද අල්විස් මහතා 1970 ජූලි මස 19 වැනි දින සිට නැවත නියමයක් කරනා තුරු පලාත් පාලන කොමසාරිස් ලෙස වැඩ බැලීමට.

ඒ. 21/67.

ලංකා පරිපාලන සේවයේ ඩබ්ලිව්. පතිරණ මහතා 1970 ජූලි මස 10 වැනි දින සිට ධීවර අධ්‍යක්‍ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 21/67.

ලංකා පරිපාලන සේවයේ එස්. ඩී. සී. සමරතුංග මහතා 1970 ජූලි මස 9 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කළුතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 7/70.

ලංකා පරිපාලන සේවයේ එෆ්. සී. පීටර්ස් මහතා, 1970 ජූලි මස 4 වැනි දින සිට, ආයතන අධ්‍යක්‍ෂ ලෙස වැඩ බැලීමට.

ඒ. 7/70.

ලංකා පරිපාලන සේවයේ බී. සී. පෙරේරා මහතා 1970 ජූලි මස 4 වැනි දින සිට ඒකාබද්ධ සේවා අධ්‍යක්‍ෂ ලෙස වැඩ බැලීමට.

ඒ. 2!/67.

,යාපනය පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත ලංකා පරිපාලන සේවයේ ජේ. එම්. සබාරත්නම් මහතා, සිය රාජකාරිවලට අතිරේකව, 1970 ජූලි මස 4 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, යාපනය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 2/70.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පංතියේ I වන ශ්‍රේණියේ ඒ. වික්‍රමාරච්චි මහතා, 1970 ජූනි මස 25 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරළය නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 32/69.

පුත්තලම් දිස්ත්‍රික්කයේ වැඩ බලන ආණ්ඩුවේ ඒජන්ත ලංකා පරිපාලන සේවයේ පී. ජී. පුංචිහේවා මහතා 1970 ජූනි මස 18 වැනි දින සිට, නැවත නියමයක් කරනතුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව පුත්තලම් පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය සුළු කර්මාන්ත අධ්‍යක්‍ෂ ලෙස වැඩ බැලීමට.

ඒ. බී. 49/69.

වැඩ බලන සහකාර පොලිස් අධිකාරි ආර්. එම්. බී. අමරසේන මහතා 1969 සැප්තැම්බර් මස 15 වැනි දින සිට සහකාර පොලිස් අධිකාරි ලෙස.

ඒ. 96/67.

ජනපද නිලධාරි සී. ඒ. පෙරේරා මහතා 1968 සැප්තැම්බර් මස 15 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු දිස්ත්‍රික් ඉඩම් නිලධාරියෙකු ලෙස වැඩ බැලීමට.

ඒ. 96/67.

ජනපද නිලධාරි ජේ. බී. අඹන්පොල මහතා, 1968 සැප්තැම්බර් මස 5 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු දිස්ත්‍රික් නිලධාරියකු ලෙස වැඩ බැලීමට.

ඒ. 96/67.

ජනපද නිලධාරි එච්. සඳුආරච්චි මහතා 1968 අගෝස්තු මස 3 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු දිස්ත්‍රික් ඉඩම් නිලධාරියකු ලෙස වැඩ බැලීමට.

ඒ. 120/67.

සහකාර මැතිවරණ නිලධාරි (ලංකා පරිපාලන සේවය) ඩබ්ලිව්. ඩී. ඇල්. පෙරේරා මහතා සිය රාජකාරිවලට අතිරේකව පාර්ලිමේන්තු මැතිවරණ රාජසභා ආඥාව 88 (අ) වගන්තිය යටතේ සහකාර පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස්වරයකු වශයෙන්.

එස්. පී. නානායක්කාර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැපැල් පෙට්ටිය අංක 500.
කොළඹ 1,
1970 දෙසැම්බර් මස 9 දින දිය.

12—663

# වෙනත් පත් කිරීම් ආදිය

**1970 අංක 412**

පා 4/සාවි 4/31, පා 4/සාවි 25/28, පා 4/සාවි 17/29, පා 4/සාවි 16/124, පා 4/සාවි 37/131, පා 4/සාවි 30/23, පා 4/සාවි 25/29, පා 4/සාවි 14/1[illegible]4, පා 4/සාවි 12/55, පා 4/සාවි 2/393, පා 4/සවි 3/156, පා 4/සාවි 3/157, පා 4/සාවි 7/70, පා 4/සාවි 9/202, පා 4/සාවි 9/208, පා 4/සාවි 38/126, පා 4/සාවි 38/127, පා 4/සාවි 38/129.

## අධිකරණ ආඥාපනත

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ජූසේ මරියා ජයමාන්න වන මම,

1. නීතිඥ, ලන්තුවා හන්දි එඩ්වින් ද සිල්වා මහතා මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරයෙකු වශයෙන් ද,
2. නීතිඥ, දිසානායක ලියනගේ ගුණවර්ධන මහතා මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරයෙකු වශයෙන් ද,
3. නීතිඥ, අහමදු ලෙබ්බේ මොහමඩ් රෂීන් මහතා හම්බන්තොට අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරයෙකු වශයෙන් ද,
4. නීතිඥ, හේමචන්ද්‍ර ඩබ්ලිව්. ගුණසේකර මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා නිල නොලත් මහෙස්ත්‍රාත්වරයෙකු වශයෙන් ද,
5. මාකේවිට අප්පුහාමිල්ලාගේ පෙ. සිරාලහාමි මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
6. අතුකෝරාල්ලාගේ පොඩිඅප්පුහාමි මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
7. වීරසිංහ ආරච්චිලාගේ ගුණවර්ධන වීරසිංහ මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
8. රණසිංහ ආරච්චිගේ දොන් ආරොන් රණසිංහ මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
9. වන්නිනායක මුදියන්සේලාගේ විසිරිබණ්ඩා වන්නිනායක මහතා පුත්තලම අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
10. පොන්නයියා තිරුනාවුක් අරසන් මහතා මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
11. එදිරිමාන්න මොනොට්ටි දයාවංශ මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
12. අතාවුද මුදියන්සේලාගේ සිරිසේන බණ්ඩාර මහතා මාතලේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
13. ජයවීර මොප්පු ආරච්චිගේ පරක්‍රම පෙරේරා මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
14. පයාගලගේ ජිනදාස ද සිල්වා මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
15. තෙවරා තන්ත්‍රිගේ සුමල් ක්ලිසි ප්‍රනාන්දු මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
16. ගබඩගේ බුද්ධදාස ආරියරත්න මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
17. නීතිඥ, සිරි ආරිය පෙරේරා මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
18. දේමුනි පීටර් ද සිල්වා මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
19. ආර්යවංශ සිරිසේන මුණසිංහ මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
20. කන්ද ආරච්චිගේ දොන් පියසේන විජේරත්න මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
21. වල්පොලගේ තෝමිස් පෙරේරා මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
22. ඉලේපෙරුමගේ එඩ්වින් පෙරේරා මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

23. විජේසිංහ කංකානම්ලාගේ පොඩි අප්පුහාමි මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

24. තිවිහාමිල්ලාගේ අබේසේකර මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

25. ඒකනායක මුදියන්සේලගේ උක්කු බණ්ඩා මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

26. විජේතුංග මුදියන්සේලාගේ අබේරත්න මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

27. කුරුප්පු ආරච්චිල්ලාගේ යහපත්හාමි මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

28. ජයසුන්දර පතිරන්නැහැලාගේ ඉග්න සියස් ජයසුන්දර මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

29. දෙහිවලගේ දොන් හර්මන් පෙරේරා මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

පත් කරමි.

ජේ. ආර්. ජයමාන්න,
අධිකරණ ඇමති.

1970 දෙසැම්බර් 9 වැනිදා,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12-665

---

1970 අංක 413

## ගැසට් නිවේදනයයි

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : පා 4/හමප 16/2.

(1) රත්නායක මුදියන්සේලාගේ පිකිරි බණ්ඩා මහතා 1970.11.5 වෙනි දින සිට කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගුල් බස්නාහිර කෝරළේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ද,

අංකය : පා/4 හමප 23/8.

(2) ලෙනගල ආරච්චිල්ලාගේ පියසේන මහතා 1970.11.14 වෙනි දින සිට කෑගල්ල දිස්ත්‍රික්කයේ කිතුල්ගල් පළාතේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ද;

පත් කරනු ලැබ ඇත්තේ ය.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

12-666/1

---

1970 අංක 414

## අවලංගු කිරීමයි

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : පා 4/හමප 23/8.

ඈස්. ඒ. චන්ද්‍රදාස මහතා, 1969.9.30 වැනි දින සිට කෑගල්ල දිස්ත්‍රික්කයේ කිතුල්ගල් පළාතේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන්,

කර ඇති පත්වීම වහාම ක්‍රියාත්මක වනසේ අවලංගු කරනු ලැබ ඇත්තේ ය.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.12.9 වැනිදා,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12-666/2

# රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

1970 අංක 415

පහත සඳහන් පත්කිරීම 1970 ඔක්තෝබර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියෝග කර ඇත :—

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ II වැනි ශ්‍රේණියේ ලිපිකරු, ඩබ්ලිව්. එම්. එච්. බී. වීරසේකර මහතා බලපිටිය කාර්යාලයේ සේවය කරමින් ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ වැඩ බලන අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයෙකු වශයෙන්.

එස්. එච්. එම්. ඉසෙඩ්. ෆාරුක්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1970 දෙසැම්බර් මස 4 දින,
කොළඹ-1,
රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේදීය.

12-586

---

# ආණ්ඩුවේ නිවේදන

## තැපැල් කාර්යාලයීය ආඥාපනත

(190 අධිකාරය වන) තැපැල් කාර්යාලයීය ආඥාපනතේ 16 වන වගන්තිය යටතේ තැපැල් සහ විදුලි සංදේශ ඇමැතිවරයා විසින් පනවන ලද ව්‍යවස්ථාව.

සී. කුමාරසූරියර්,
තැපැල් සහ විදුලි සංදේශ ඇමති.

1970.12.11 දින,
කොළඹදී ය.

### ව්‍යවස්ථාව

(190 අධිකාරය වන) තැපැල් කාර්යාලයීය ආඥා පනතේ 16 වන වගන්තිය යටතේ පනවා, අංක 14,707 සහ 1966 අගෝස්තු 5 දින දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, අංක 14,933 සහ 1970 නොවැම්බර් 20 දින දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථාව, ඊට යාකොට ඇති උපලේඛණයෙහි 85 වන විෂයයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් විෂයය ඇතුළත් කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"86. ජාත්‍යන්තර අධ්‍යාපන වර්ෂය 1970 සැමරීම සඳහා නිකුත් කරනු ලැබූ ශත 15 වටිනාකමින් යුත් තැපැල් හා ආදායම් මුද්දර, මුද්දරයේ දැක්වෙන පුස්කොළ පොතෙන් බුද්ධ වර්ෂ 455 සිට 467 දක්වා වූ වර්ෂවලදී ත්‍රිපිටකය (බුදුරජාණන් වහන්සේගේ ධර්මය අන්තර්ගත පාලිපොත්) ග්‍රන්ථාරූඪ කිරීම පිළිබඳ වූ වැදගත් අධ්‍යාත්මික සිද්ධියක් නිරූපනය කරයි. සම කේන්ද්‍රික චක්‍ර ඉරිවලින් විද්‍යාවෙන් අලංකෘත මිනිස් හිසක ස්වරූපයක් පිළිබිඹු වේ."

12-722

---

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණත

### 25 (1) වෙනි වගන්තිය යටතේ නියෝගය

ප්‍රවාහන අමාත්‍ය ධුරන්ධර ලෙස්ලි සයිමන් ගුණවර්ධන වන මම, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූද ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනාකර ඇත්තාවූද, නිශ්චල දේපොළ අත්කරගැනීම 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මෙයින් අනුමත කරමි.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහන ඇමති.

1970.12.7 වෙනි දින,
කොළඹදීය.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, නිල්දණ්ඩාහින්න ග්‍රාමසේවක කොට්ඨාශයේ, යටි පළාත ගම්කාර්ය සභා සීමාවන් තුල නිල්දණ්ඩාහින්න ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, ප. 0 ක් පමණවූ ඉඩම් කොටසක් :—

උතුරට : නිල්දණ්ඩාහින්නේ ඒ. බී. එම්. මුතුබණ්ඩාට අයිතියයි කියන ඉඩමය ;
නැගෙනහිරට සහ දකුණට : ගල්කැටිවෙල මාර්ගය ;

බස්නාහිරට : ඊතුමුල්ල මාර්ගය.

යන මේ මායිම් තුළ පිහිටියේ ය.

2. අත්කර ගැනීමට යෝජිත ඉඩම් කොටසේ විස්තර මෙසේ ය :—

ඉඩමේ නම : නිල්දණ්ඩාහින්න පතන වත්ත ;

විස්තරය : කොස්ගස් 7ක් සහිත වගාවන් අත්හැර දමනු ලැබූ තේ ඉඩමක් ;

ප්‍රමාණය : දළ වශයෙන් අ. 0, රූ. 3, ප. 0ක් පමණ ;

අයිතිය ප්‍රකාශ කරන්නන්ගේ නම් සහ ලිපිනයන් :

(i) සෝමවතී ගලගොඩ මහත්මිය, නිල්දණ්ඩාහින්න ;

(ii) මල්ලිකා බැද්දෙවෙල මහත්මිය, අම්පිටිය, මහනුවර.

12-623

---

ඇල්.ඩී.—බී. 15/36.

## බන්ධනාගාර ආඥාපනත

### 35 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥාපනතෙහි 35(1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ජූසේ මරියා ජයමාන්න වන මම, වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජික යින් වශයෙන් 1970 නොවැම්බර් මස 9 වෙනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා, ජෝසප් පෙරේරා වීරසිංහ මහතා, රාජකරුණා මොහොට්ටි අප්පුහාමිලාගේ සරත් සිරිපාල රාජකරුණා මහතා, දොන් ෆ්‍රෙඩ්රික් අතුකෝරල මහතා සහ මුණසිංහ අච්චි ලේකම්ලාගේ සමරසේන මුණසිංහ මහතා මෙයින් පත් කරමි.

ජේ. ඇම්. ජයමාන්න,
අධිකරණ ඇමති.

1970 දෙසැම්බර් 9 වෙනි දින,
කොළඹ දී.

12-720

---

## 1963 අංක 6 දරණ ගිනිකූරු නිෂ්පාදනය (විධිමත් කිරීමේ) පනතේ 3 (3) වන වගන්තිය යටතේ පනවන ලද නිවේදන

1963 අංක 6 දරණ ගිනිකූරු නිෂ්පාදනය (විධිමත් කිරීමේ) පනතේ 3 (3) වන වගන්තිය යටතේ කර්මාන්ත හා ධීවර ඇමති විසින් පනවන ලදුව, 1969.3.22 දින අංක 14,846/1 හා 1969.12.13 දින අංක 14,882/3 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රවල පලකරන ලද නිවේදන, 1970.9.12 දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් ද, උත්තර මන්ත්‍රී මණ්ඩලය විසින් පිළිවෙලින් 69.5.10 දින හා 70.3.20 දිනද අනුමත කරනු ලැබ ඇති බව මහජනයාගේ දැන ගැනීම සඳහා 1963 අංක 6 දරන ගිනිකූරු නිෂ්පාදනය (විධිමත් කිරීමේ) පනතේ 9 (4) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. වී. පොන්සේකා,
ස්ථිර ලේකම්.
කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය.

1970.11.30 දින,
කොළඹ දීය.

12-589

---

## නොතාරිස් ආඥාපනත (107 අධිකාරය)

ඊනා මනෝරානී කොරයා මහත්මිය කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි සහ සිංහල භාෂාවන්ගෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹදීය.

12-563

---

## නොතාරිස් ආඥාපනත (107 අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුලත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධූරයේ කටයුතු කිරීමට කිංස්ලි විජේසිංහ මහතාට දෙන ලද බලපත්‍රය නොතාරිස්වරුන් පිළිබඳ (107 අධිකාරයවූ) ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල අනුව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1970 ඔක්තෝබර් මස 8 දින අස්කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 22 දින,
කොළඹදීය.

12-562

---

## අනුමත/ලියාපදිංචි කර්මාන්තවලට අමු ද්‍රව්‍ය හා ඇසිරීම් ද්‍රව්‍ය ආනයනය සඳහා දෙනු ලබන අත්තිකාරම් විදේශ විනිමය පංගුව

1971 වර්ෂය සඳහා අත්තිකාරම් විනිමය පංගු ලගදීම නිකුත් කරන බව කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කර්මාන්ත ව්‍යවස්ථා අංශයෙන් අමු ද්‍රව්‍ය සහ ඇසිරීම් ද්‍රව්‍ය ආනයනය සඳහා විදේශ විනිමය පංගු ලබන සියලුම අනුමත/ලියාපදිංචි කර්මාන්තායතනවලට මෙයින් දැනුම් දෙනු ලැබේ.

1970 වර්ෂයේදී රු. 50,000 කට අධික වාර්ෂික විනිමය පංගුවක් ලැබූ සියලුම අනුමත/ලියාපදිංචි කර්මාන්ත ආයතන 1971 අත්තිකාරම් විනිමය පංගුවෙන් බලපත්‍ර ලබා ගැනීමට පෙර 1970 පළමුවෙනි හා දෙවෙනි කාර්තු සඳහා වෙළඳ පිරිවැටුප් බදු ගෙවන ලද රිසිට් පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

එල්. එන්. ද එල්. බණ්ඩාරනායක,
අතිරේක ස්ථිර ලේකම්,
කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය.

1970.12.10, කොළඹ.

12-671

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 මැයි 8 වැනි දින අංක 14,905 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 30 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ නාවිදන්වෙලි ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායක යින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) නාවිදන්වෙලි පදිංචි උලගනාදන් සරවනමුත්තු මහතා

(2) නාවිදන්වෙලි පදිංචි වීරසිංහම් සින්නතුරෙයි මහතා

(3) නාවිදන්වෙලි, පදිංචි මුතුපිල්ලෙයි කුලන්දයිවේල් මහතා

(4) නාවිදන්වෙලි. අංක 7/75 හි පදිංචි සින්නතම්බි අලගකෝන් මහතා.

(5) නාවිදන්වෙලි. අංක 7/53 හි පදිංචි පොන්නයියා වන්ද රාසපිල්ලෙයි මහතා.

(6) නාවිදන්වෙලි. අංක 15/39/1 හි පදිංචි අන්තෝනි අරුලප්පු පාය්වා මහතා.

(7) නාවිදන්වෙලි. අංක 15/1 හි පදිංචි තාමෝදරම් වේල් මූරුගු මහතා.

(8) මධ්‍යම කඳවුර. අංක 11/69 හි පදිංචි පිල්ලේයියාන්තම්බි වේලුපිල්ලෙයි මහතා.

(9) මධ්‍යම කඳවුර. අංක 11/35 හි පදිංචි කුප්පෙයර් කන්තෙයියා මහතා.

(10) මධ්‍යම කඳවුර, අංක 12/124 හි පදිංචි මොහමඩ් ඉස්මයිල් ආදම් බාවා මහතා.

(11) නාවිදන්වෙලි, අන්නමලේ පදිංචි සින්නතුරෛ තාමෝදරම් මහතා.

(12) නාවිදන්වෙලි, අන්නමලේ පදිංචි ආරුමුගම් සදාසිවම් මහතා.

(13) කල්මුනේ, චවලකඩේ පදිංචි සින්නතම්බි සුබ්‍රමණියම් මහතා.

(14) සමන්තුර, සොරිකල්මුණේ, අංක 6/12 හි පදිංචි සින්න තම්බි අහමදු ලෙබ්බේ මහතා.

(15) කල්මුනේ, චවලකඩේ, අංක 5/62 හි පදිංචි උදුමා ලෙබ්බේ අබ්දුල් කරීම් මහතා.

(16) කල්මුනේ, චවලකඩේ, අංක 5/19 හි පදිංචි මහමදු ලෙබ්බේ සාහුල් හමීදු මහතා.

(17) මධ්‍යම කඳවුර, යුනිට් 4 පදිංචි ඉලට්සුමනන් රාජසිංහම් මහතා.

(18) මධ්‍යම කඳවුර, අංක 4/7 හි පදිංචි මයිල්වාගනම් රත්න සිංහම් මහතා.

(19) මධ්‍යම කඳවුර, ඒඅයි පදිංචි වීරසිංහම් සිවරත්නම් මහතා.

(20) මධ්‍යම කඳවුර, 12 වෙනි ජනපදය, 53 වෙනි නිවාසය පදිංචි ආදම්බාවා අල්ලාපිච්චෙයි මහතා.

(ආ) නාවිදන්වෙලි පදිංචි උලගනාදන් සරවනමුත්තු මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 23 දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12-590

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 මැයි 8 වැනි දින අංක 14,905 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 23 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය සඳහා පිහිටුවන ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) අම්බලන්ගොඩ, පොල්වත්ත, "සොමිලින්" හි පදිංචි අමුගොඩ කාරියවසම් සිත්තරගේ එඩ්වින් සිල්වා මහතා.

(2) අම්බලන්ගොඩ, කුලරත්න පාර, අංක 28/2 හි පදිංචි බැනිස්ටර් තෝමස් ප්‍රනාන්දු මහතා.

(3) අම්බලන්ගොඩ, පටබැඳිමුල්ල, අංක 427 හි පදිංචි අම්බලන්ගොඩ ගුරුනාන්සේලාගේ චන්ද්‍රරත්න ලැම්බට් පෙරේරා මහතා.

(4) අම්බලන්ගොඩ, මුහුදු වෙරළ පාර, අංක 78/1 හි පදිංචි දොන් ඒබ්‍රහම් සමරසිංහ මහතා.

(5) අම්බලන්ගොඩ, සංඝරාජ මාවත, අංක 6 හි පදිංචි ගිනිගේ ගිරිගෝරිස් ද සිල්වා මහතා.

(6) අම්බලන්ගොඩ, වික්‍රමසූරිය පාර, අංක 15/2 හි පදිංචි ජේම්ස් ඩැනියෙල් නානායක්කාර මහතා.

(7) අම්බලන්ගොඩ, පටබැඳිමුල්ල, "සෙවන" හි පදිංචි වේහැල්ල මුදලිගේ විල්සන් මහතා.

(8) අම්බලන්ගොඩ, කටිත්ත කන්ද, කලුවඩුමුල්ල පාරේ පදිංචි ගුස්තිනු කුරු වඩු රත්නසේන ද සිල්වා මහතා.

(9) අම්බලන්ගොඩ, තුඩුවෙමුල්ල, දෙල්දූව පාරේ පදිංචි කරුණාපාල වරුශවිතාන මහතා.

(10) අම්බලන්ගොඩ, මහඅම්බලන්ගොඩ, අංක 42/1 හි පදිංචි ගිනිදූමගේ පීරිස් සිල්වා මහතා.

(11) අම්බලන්ගොඩ, මහවීදිය, අංක 99 හි පදිංචි පින්තේරු මහවඩුගේ සයිමන් ප්‍රනාන්දු මහතා.

(12) අම්බලන්ගොඩ, මහඅම්බලන්ගොඩ පදිංචි ඉහල හේවා පීඩී ද සිල්වා මහතා.

(13) අම්බලන්ගොඩ, හිරේවත්ත, මහවීදිය, අංක 53 හි පදිංචි රත්ගම ගුරුගේ උපතිස්ස මහතා.

(14) අම්බලන්ගොඩ, අළුත් පාර, අංක 53ඒ හි පදිංචි කලන් සූරිය මරදානගේ විජයපාල මහතා.

(15) අම්බලන්ගොඩ, විලේගොඩ, පොල්වත්ත පාර, අංක 3/9 හි පදිංචි සෝමගේ ඒබ්‍රහම් ද සිල්වා මහතා.

(16) අම්බලන්ගොඩ, අලුත් පාර, අංක 38 හි පදිංචි කරුණාතුංග පෙත්තාවඩු මහතා.

(17) අම්බලන්ගොඩ, පනියන්දූව, අංක 49, "ජයන්ති" හි පදිංචි ඉහල වතුමුල්ලගමගේ මෙත්තානන්ද ජයවීර මහතා.

(18) අම්බලන්ගොඩ, පනියන්දූව, අංක 16 හි පදිංචි අප්පුවා වඩුමේස්ත්‍රී ජිනදාස මහතා.

(19) අම්බලන්ගොඩ, දෙගොඩ, අංක 6 හි පදිංචි ජේම්ස් විතාන මහතා.

(20) අම්බලන්ගොඩ, හිගල්දූව පාර, අංක 9/2 හි පදිංචි පින්නදූවෙ හේවා මහින්දපාල ද සිල්වා මහතා.

(21) අම්බලන්ගොඩ, පෝරඹ, "වයලට් විලා" හි පදිංචි පැට්රික් තෝමස් රණසූරිය මහතා.

(22) අම්බලන්ගොඩ, පෝරඹ, "රම්‍ය" හි පදිංචි ගල්වඩුගේ ජයසිංහ මහතා.

(23) අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල, ශ්‍රී විජයරාම පාර, අංක 12/2 හි පදිංචි ජසෙන්තු ලියන ආනන්ද සිල්වා මහතා.

(24) අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල, පඤ්ඤාලෝක මාවත, අංක 17/2 හි පදිංචි අප්පුවා වඩු මේස්ත්‍රී වලේතිස් ද සිල්වා මහතා.

(25) අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල, පීරිස් වෙද මාවත, අංක 35, "ශාන්ති" හි පදිංචි ජිනපාල වරුසවිතාන තිලකසුන්දර වෙද ආරච්චි මහතා.

(26) අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල, ශ්‍රී විජයරාම පාර, අංක 8 හි පදිංචි නයිදුවාවඩු ධනසිරි ද සිල්වා මහතා.

(27) අම්බලන්ගොඩ, පොල්වත්ත පදිංචි බදුගොඩහේවා ගංගාදර ද සිල්වා මහතා.

(28) අම්බලන්ගොඩ, පොල්වත්ත පදිංචි බෙන්තොටගේ ප්‍රේමසිරි වික්‍රමතිලක මහතා.

(ආ) අම්බලන්ගොඩ, පොල්වත්ත, "සොමිලින්" හි පදිංචි අමුගොඩ කාරියවසම් සිත්තරගේ එඩ්වින් සිල්වා මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 දෙසැම්බර් මස 7 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12-588/1

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 මැයි 8 වැනි දින අංක 14,905 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ

උපලේඛනයෙහි අංක 26 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ කරන්දෙනිය ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) වතුගෙදර, දංගහවිල පදිංචි කරුණාරත්න හෙන්රි විල්සන් මහතා.

(2) කරන්දෙනිය, කීනගහතොට පදිංචි කුඩලිගමගේ පිලෝරිස් ප්‍රනාන්දු මහතා.

(3) කරන්දෙනිය, මහල්දණ්ඩ, "නිම්මිනි" හි පදිංචි අරනියෙල් වැලිවිටිගොඩ අමරසේකර මහතා.

(4) ඇල්පිටිය, කිරිපේද්ද පදිංචි හැරල්ඩ් සුමනදාස මහතා.

(5) කරන්දෙනිය, මුල්කැටියතොට, "මිහිර" හි පදිංචි සුදුවදේව වියෝනිස් ප්‍රනාන්දු මහතා.

(6) කරන්දෙනිය, මුල්කැටියාතොට පදිංචි ජයතිස්ස අමරසිංහ මහතා.

(7) ඇල්පිටිය, කුරුඳුගහහැතැප්ම, බටපොල පාරේ පදිංචි පේදුරුහේවා සිරිතුංග මහතා.

(8) ඇල්පිටිය, අඟුලුගල්ල පදිංචි තොටගමුවගේ මිගෙල් ප්‍රනාන්දු මහතා.

(9) කරන්දෙනිය, දිවියගහවෙල, බෝරකන්දවත්ත අසල, අංක 87 හි පදිංචි කස්තුරි ආරච්චිගේ නිව්ටන් මහතා.

(10) කරන්දෙනිය, බොරකන්ද පදිංචි ඉලන්දාරිදේව ඊඩින් මහතා.

(11) කරන්දෙනිය, කැකිරිය පදිංචි ගරුමුනි සැක්සන් ද සොයිසා මහතා.

(12) කරන්දෙනිය, දිවියගහවෙල පදිංචි කලුවාදේව ආරියසේන මහතා.

(13) කරන්දෙනිය, දකුණු මාගල පදිංචි පේදුරුහේවගේ සොමියෙල් කරුණාරත්න මහතා.

(14) කරන්දෙනිය, දකුණු මාගල පදිංචි හේවා වසම් නෝරිස් ආරියරත්න මහතා.

(15) වතුගෙදර, එගොඩවෙල පදිංචි සරත් සුමතිපාල මහතා.

(16) වතුගෙදර, දංගහවිල පදිංචි පේමසිරි ආරියරත්න මහතා.

(17) වතුගෙදර, ඇරවාවිල පදිංචි ජෝශප් එදිරිසිංහ මහතා.

(18) වතුගෙදර, පනාපිටියකන්ද පදිංචි කලුවදේව පැලිස් මහතා.

(19) කරන්දෙනිය, බොරකන්ත පදිංචි ලංකා ගීගනගේ සුමනදාස මහතා.

(20) ඇල්පිටිය, කොස්වතුමානාන පදිංචි ඉලන්දාරිදේව අරලියෙස් මහතා.

(21) ඇල්පිටිය, කොස්වතුමානාන, "මයුරසිරි" හි පදිංචි වලවැත්ත හේවාගේ වේඩින් මහතා.

(22) වතුගෙදර, මහගොඩ පදිංචි කලුවදේව ලයනල් මහතා.

(23) කරන්දෙනිය, දකුණු මාගල පදිංචි පුංචා හකුරු රයිවින් මහතා.

(24) ඇල්පිටිය, අඟුනකැටිය, පදිංචි සුදුදේව පියදාස මහතා.

(25) වතුගෙදර, කැරුව පදිංචි සුදුහකුරු අරනියෙල් මහතා.

(26) වතුගෙදර, පනාපිටිය මුස්ලිම් ජනපදයේ පදිංචි සාහුල් හමීඩ් මොහොමඩ් මහතා.

(27) වතුගෙදර, ඇරවාවිල, පදිංචි පතිරණ ආරච්චිගේ ප්‍රේමදාස ජයවීර මහතා.

(28) නවදගල්ල, අඟුලුගල්ල පදිංචි සැල්ඩින් සුබසිංහ මහතා.

(29) වතුගෙදර, ඇරවාවිල පදිංචි සිරිසේන දේවප්‍රිය මහතා.

(30) කරන්දෙනිය, මඩකුඹුර පදිංචි ජිනදාස ජයවික්‍රම මහතා.

(ආ) වතුගෙදර, දංගහවිල පදිංචි කරුණාරත්න හෙන්රි විල්සන් මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 දෙසැම්බර් මස 7 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12-588/2

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 ජූලි 20 දින අංක 14,915/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 26 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ බටපොලගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) බටපොල, "සේනානි" හි පදිංචි මොරවක්කෝරලේගේ මානියෙල් කරුණාසේන මහතා,
(2) බටපොල, බටකැලේ පදිංචි හේවාහකුරු චාලින් මහතා,
(3) බටපොල, මිල්ලවත්ත "මිහිර" හි පදිංචි මාවනානෙහේවා ගුණසිරි ද සිල්වා මහතා,
(4) බටපොල, අලුත්වත්ත පදිංචි සන්ද්‍රාමරක්කල විලියම් සිල්වා මහතා,
(5) නින්දාන, බොරලුවගොඩ, "සමන්" හි පදිංචි විජේදාස හික්කඩුව ලියනගේ මහතා,
(6) නින්දාන, නාගහගොඩ පදිංචි ගම්මැද්දහේවා ප්‍රෙමරත්න ද සිල්වා මහතා,
(7) නින්දාන, පදිංචි පේදුරුහේවා ඉසන් සිල්වා මහතා,
(8) බටපොල, ඉලුක්පිටිය පදිංචි පේදුරුහේවා සුමතිපාල මහතා,
(9) බටපොල, මානම්ගොඩ පදිංචි වඩුතන්ත්‍රී සරදියෙල් සිල්වා මහතා,
(10) බටපොල, ඉලුක්පිටිය පදිංචි රාජපක්ෂ තුසෙන්හන්දි ආරියසේන මහතා,
(11) බටපොල, පොල්ලැව්ව පදිංචි ජසෙන්තුනම්බි දානියෙල් ද සිල්වා මහතා,
(12) බටපොල, පොල්ලැව්ව පදිංචි ගම්මැද්දහේවා අවිනෝරිස් ද සිල්වා ජයසේකර මහතා,
(13) අම්බලන්ගොඩ, ගොඩහේන පදිංචි පොන්නායමන් ගුනපාල මහතා,
(14) අම්බලන්ගොඩ, ගොඩහේන පදිංචි සවුන්ද්‍රා මරක්කල ආගිරිස් සිල්වා මහතා,
(15) බටපොල, බටදූව, "මානෙල්" හි පදිංචි ලොකු ලියන අමරවංශ මහතා,
(16) නින්දාන, ගෙඩමාවත පදිංචි කොඩිකාර පටබැඳි ඩේවිඩ් සිල්වා මහතා,
(17) බටපොල, මහවත්ත පදිංචි මාවනානෙහේවා උපනෝරිස් පියසේන මහතා,
(18) බටපොල, දොරල පදිංචි අම්බලන්ගොඩගේ පීටර් සිල්වා මහතා,
(19) බටපොල, දොරල පදිංචි පේදුරුහේවා ඇඩ්මන් ද සිල්වා මහතා,
(20) බටපොල, ඔළබැද්ද පදිංචි කලුතන්ත්‍රී පටබැඳි ධනපාල මහතා,
(21) බටපොල, දන්කැටිය පදිංචි වඩුමෙස්ත්‍රි ගුණපාල මහතා,
(22) බටපොල, ඊරියගහදොල, "සිරිසර" හි පදිංචි සෝමසිරි ලොකුගේ මහතා,
(23) බටපොල, මහවත්ත පදිංචි මාවනානෙහේවා එඩ්වින් තෝමස් ද සිල්වා මහතා,
(24) බටපොල, කොබෙයිතුඩුව පදිංචි ඉගලහේවා පියදාස ද සිල්වා මහතා,
(25) බටපොල, කොබෙයිතුඩුව පදිංචි කාරියවසම් තිරාණගමගේ සුගතපාල මහතා.

(ආ) බටපොල, "සේනානි" හි පදිංචි මොරවක්කෝරලේගේ මානියෙල් කරුණාසේන මහතා, ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 දෙසැම්බර් මස 7 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.

12-664

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි කොක්කුවිල් ගම් ප්‍රදේශයේ සමගිදායකයින් ගේ සභාවේ සභාපති ව සිට එම ධුරයෙන් ඉල්ලා අස්වූ කොක්කුවිල්, කොක්කුවිල් හින්දු විද්‍යාලයේ විද්‍යාලයාධිපති, සින්නප්ප කනගරත්නම් සන්දසාමි මහතා වෙනුවට කොක්කුවිල්, කොක්කුවිල් නැගෙනහිර පදිංචි රාසයියා කන්දයියා මහතා එකී සභාවේ සාමාජික ධුරය දරණ කාලය තුළ දී එම සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු
ලේකම්.

1970 දෙසැම්බර් මස 7 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

12-667

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 ජූලි 28 වැනි දින අංක 14,916/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 16 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මුල්ලිපොතාන ගම් ප්‍රදේශය සඳහා පිහිටු වනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි.

1. මුල්ලිපොතාන, 7 ඒකකය, එච්. ඇල්. 418 හි පදිංචි මොහොමඩ් මාතාර් වාප්පුතම්බි මහතා.
2. මුල්ලිපොතාන, 8 ඒකකය, අංක 212 හි පදිංචි යාසින් අබ්දුල් ජබාර් මහතා.
3. මුල්ලිපොතාන, 7 ඒකකය, අංක 306 හි පදිංචි සේගුමාතාර් ලෙබ්බේ මොහමඩ් ඉස්මායිල් ලෙබ්බේ මහතා.
4. මුල්ලිපොතාන, 7 ඒකකය, අංක 413 හි පදිංචි මුරුසාලීන් අබ්දුල් රාහීම් ලෙබ්බේ මහතා.
5. මුල්ලිපොතාන, 8 ඒකකය අංක 179 හි පදිංචි උසාන් මොහමඩ් ලෙබ්බේ මහතා.
6. බටහිර තම්බලගාම, 17 ඒකකය, අංක 505 හි පදිංචි එස්. එම්. සෙයියදු මවුලානා ජේසින් මවුලානා මහතා.
7. බටහිර තම්බලගාම, 17 ඒකකය, අංක 656 හි පදිංචි ජෙයිනුදීන් අබ්දුල් රසාක් මහතා.
8. තම්බලගාම, 97 සැතපුම් කණුව හංදිය හි පදිංචි තේරිමාදෙර ජුංචි සිංඤෝ මහතා.
9. බටහිර තම්පලගාම, 17 ඒකකය, අංක 606 හි පදිංචි මුහම්මදු උසාන් අම්සදීන් මහතා.
10 බටහිර තම්පලගාම, 17 ඒකකය, අංක 535 හි පදිංචි මිටින් අබ්දුල් මජීදු මහතා.
11. ගන්තලාව, 10 ඒකකය, නො. 115 හි පදිංචි අබ්දුල් මානබ් ජේසිනුදීන් මහතා.
12. ගන්තලාව, 13 ඒකකය, නො. 22 හි පදිංචි අගලවෙලේගෙදර මුදලිහාමි මහතා.
13 ගන්තලාව, 8 ඒකකය, නො. 132 හි පදිංචි ඉලංගගේ සිමන් තිසේරා මහතා.
14. මුල්ලිපොතාන හන්දිය, 8 ඒකකය හි පදිංචි දහනායක මුදියන් සේලාගේ හීන් බණ්ඩ මහතා.
15. තම්බලගාම, බටහිර ජනපදය එච්. එල්. 738 හි පදිංචි විනාසිතම්බි සභාරත්නම් මහතා.
16. ගන්තලාව, 9 ඒකකය, නො. 1112 හි පදිංචි කෝනමලෙයි චිත්‍රවේලු මහතා.
17. ගන්තලාව, 9 ඒකකය, නො. 1116 හි පදිංචි මාරිමුත්තු කාලි අප්පු මහතා.
18. මුල්ලිපොතාන, 7 ඒකකය, අංක 361 හි පදිංචි සෙයියදු මොහමඩ් මොහමඩ් ලෙබ්බේ මහතා.
19. තම්බලගාම, ගල්මැටිය, නො. 61 හි පදිංචි වින්සන් සිල්වා මහතා බාරේ, මාලින් යුප්‍රේසිය ප්‍රනාන්දු මහත්මිය.

(ආ) මුල්ලිපොතාන, 7 ඒකකය, එච්. ඇල්. 418 හි පදිංචි මොහමඩ් මාතාර් වාප්පුතම්බි මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

12-721

---

## මිල පාලන ආඥාව

නියෝජ්‍ය මිල පාලක (විවිධ ද්‍රව්‍ය) ඇයි. ඕ. තෝ. ජී. ප්‍රනාන්දු විසින් පනවනු ලැබූ 1970 නොවැම්බර් මස 10 වෙනි දින අංක 14,931/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද (විවිධ ද්‍රව්‍ය) මිල පාලනයට අදාළ පහත සඳහන් ආඥාවන්, විදේශීය හා දේශීය වෙළෙඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4(7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ:—

(1) 1970 අංක 2 දරණ (බයිසිකල් ටයර් ටියුබ්) මිල පාලන ආඥාව.

(2) 1970 අංක 1 දරණ උදලු මිල පාලන ආඥාව.

(3) 1970 අංක 1 දරණ (මොනිටර්ස් අභ්‍යාස පොත්) මිල පාලන ආඥාව.

(4) 1970 අංක 2 දරණ (අභ්‍යාස පොත්) මිල පාලන ආඥාව.

ජ. බ. කැලේගම,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 27 දින,
කොළඹ දීය.

12-594

---

## මිල පාලන ආඥාව

සහකාර මිල පාලක (ආහාර සහ විවිධ ද්‍රව්‍ය) වන, වෛද්‍ය කේ. ඩී. එෆ්. පියසීලි, විසින් පනවනු ලැබ, 1970 නොවැම්බර් මස 5 වැනි දින, අංක 14,930/11 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1969 (ඖෂධ) මිල පාලන ආඥාව විදේශීය හා දේශීය වෙළෙඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4(7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජ. බ. කැලේගම,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 27 දින,
කොළඹ දීය.

12-595

ඇල්.ඩී.—බී. 135/29

## වන්දනා ගමන් පිළිබඳ ආඥාපනත

### තලවිල ශාන්ත ආනා මංගල්‍යය සම්බන්ධ රෙගුලාසි

(175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් පිළිබඳ ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු භාර ඇමති තැන්පත් ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ තලවිල ශාන්ත ආනා පල්ලියට යන සියළු වන්දනා ගමනකටම අදල වන පරිදි මෙහි පහත දක්වෙන රෙගුලාසි මෙකී නිවේදනයෙන් පනවමි.

ෆිf. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1970 නොවැම්බර් මස
කොළඹ දීය.

### රෙගුලාසි

1. මෙම රෙගුලාසිවල—

" කඳවුරු ප්‍රදේශය " යනුවෙන් අදහස් කෙරෙන්නේ—

(i) තලවිල ශාන්ත ආනා පල්ලියේ සිට හැතැප්මක අර්ධ විෂ්කම්භය ඇතුළත පිහිටි භූමිභාගය සහ

(ii) පලකුඩා සිට තලවිලට වැටී ඇති මාර්ගය දෙපසින් යාර පනහක් ඇතුළත පිහිටි භූමි භාගයයි

" ආණ්ඩුවේ ඒජන්ත " යන්නෙන් අදහස් කෙරෙන්නේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත සහ ඔහු වෙනුවෙන් වැඩ බැලීමට විධිවූ පරිදි බලය පවරනු ලැබූ ඕනෑම නිලධාරියෙකි.

2. ආණ්ඩුවේ ඒජන්තගේ විශේෂ නියෝගයකින් හෝ සාමාන්‍ය නියෝගයකින් කඳවුරු ගැසීම තහනම් කරන ලද කඳවුරු ප්‍රදේශය තුළ කිසිම ස්ථානයක කිසිම පුද්ගලයකු විසින් කඳවුරු නොගැසිය යුතුය.

3. ආණ්ඩුවේ ඒජන්ත විසින් හෝ ඔහුගේ අනුමැතිය ඇතිව හෝ ඒ සඳහා සලසන ලද තැන්හි හැර අන් කිසිම තැනක කිසිවකු කඳවුරු ප්‍රදේශය තුළ මළ පහ නොකළ යුතුය.

4. ආණ්ඩුවේ ඒජන්ත විසින් හෝ ඔහුගේ අනුමැතිය ඇතිව හෝ ඒ සඳහා සලසන ලද තන්හි හෝ සපයන ලද බඳුන්වල හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත අන් කිසිම තැනක කිසිවකු විසින් කුණු වතුර හෝ කැළි කසල හෝ නොදැමිය යුතුය.

5. (අ) ඝාතනය පිණිස ගෙනෙන ලද්දවූ නැතහොත් එකී ප්‍රදේශය තුළ තබාගැනීමට ආණ්ඩුවේ ඒජන්තගේ සාමාන්‍ය නියෝගයකින් හෝ විශේෂ අවසර දෙන ලද්දවූ හෝ ගවයන් හැර කිසිම ගවයකු කඳවුරු ප්‍රදේශය ඇතුළත තබා නොගත යුතුය.

(ආ) ගව ගාලක් වශයෙන් විශේෂයෙන් තනවන ලද්දවූ හෝ ඒ සඳහා ආණ්ඩුවේ ඒජන්ත විසින් අනුමත කරන ලද්දවූ හෝ තැනක හැර කඳවුරු ප්‍රදේශය ආසන්නයෙහි කිසිම ගවයකු තබා නොගත යුතුය.

(ඇ) ඒ සඳහා සලසා ඇති ආසන්නම ස්ථානයට ගවයන් බලාගන්නා පුද්ගලයා විසින් ගොම ගෙනයාමට සැලැස්විය යුතුය. ගවයන් සිටින ස්ථානය නිතරම පිරිසිදුව තබාගත යුතුය.

(ඈ) ආණ්ඩුවේ ඒජන්ත විසින් හෝ ඔහුගේ අනුමැතිය ඇතිව හෝ සලසන ලද තැන්වල හැර කඳවුරු ප්‍රදේශයේ වෙනත් තැන්වල කිසිවකු විසින් වාහන නවත්වා නොනැබිය යුතුය. වෙනත් තැනක වාහනයක් නවත්වා ගැනීමට කැමති කෙනෙකු විසින් ආණ්ඩුවේ ඒජන්තගෙන් විශේෂ අවසර පත්‍රයක් ලබාගත යුතුය. වාහන නවත්වා තැබීම සඳහා අයකිරීමට අදහස් කරන ගාස්තු ආණ්ඩුවේ ඒජන්ත ලවා අනුමත කරවා නොගෙන කිසිවකු විසින් මෝටර් රථ හෝ වෙනත් වාහන නවත්වා තැබීමේ ස්ථානයක් පිහිටවිය යුතු නොවේ.

6. කඳවුරු ප්‍රදේශය තුළ අලෙවි කෙරෙන සියළු ආහාර වර්ග—

(අ) පිරිසිදු කඩදසිවල නැතහොත් රෙදිවල එතීමෙන් හෝ දවටීමෙන් හෝ,

(ආ) වීදුරු පෙට්ටිවල බහා තබනු ලැබීමෙන් හෝ,

(ඇ) කඳවුරු ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් හෝ සෞඛ්‍ය නිලධාරි තැන විසින් හෝ අනුමත කරන ලද බඳුනක ඇහිරීමෙන් හෝ මැස්සන්ගෙන් හා දූලියෙන් රැකගත යුතුය.

7. කඳවුරු ප්‍රදේශයේ පිරිසිදුකම කෙලෙසීමට හේතුවක් විය හැකි අන්දමේ කිසිවකුටද ආසාදක රෝගයකින් පෙළෙන්නාවූ කිසිවකුටද කඳවුරු ප්‍රදේශයට ඇතුළුවීමට ඉඩ නොදිය යුතුය.

8. උත්සව සමයේදී කඳවුරු ප්‍රදේශය තුළ වසංගතයක් ඇති වුවහොත් වන්දනාකරුවනට වන්දනා භූමියෙන් පිටවන ලෙස විධානය කිරීමටද ඔවුන් පිටවී යා යුතු මාර්ගය හා පිළිවෙල නියම කිරීමටද ආණ්ඩුවේ ඒජන්තට පුළුවන.

9. කඳවුරු ප්‍රදේශය තුළදී අසාදක රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙන සෑම පුද්ගලයකු විසින්ද දැනුවත්ව එබඳු රෝගයකින් පෙළෙන කෙනෙකු සමග වෙසෙන සෑම පුද්ගලයකු විසින්ද ඒ බව සෞඛ්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකට හෝ වාර්තා කළ යුතුය.

10. කඳවුරු ප්‍රදේශයෙහි කිසියම් වැවක් හෝ ළිඳක් විශේෂ කාර්‍යයක් උදෙසා වෙන්කොට ඒ බවට දැන්වීමක් එම ස්ථානයෙහි ප්‍රදර්ශනය කර ඇති විටක, එසේ වෙන් කරන ලද කාර්‍යයෙන් බැහැර වෙනත් කටයුත්තක් සඳහා එම වැව හෝ ළිඳ පාවිච්චි නොකළ යුතුය.

11. ඒ සඳහා කල් ඇතිව ආණ්ඩුවේ ඒජන්තගෙන් බලපත්‍රයක් ලබා නොගෙන කිසිවකු විසින් කිසිම බේකරියක්, සිසිල් පැන් කම්හලක්, සරුවත් හෝ අයිස්ක්‍රීම් පලක්, හෝ කෝපි කඩයක්, බත්කඩයක් හෝ පිළියෙළ කළ ආහාර වෙළඳාම සඳහා තබා ඇති වෙනයම් කඩයක් පවත්වා ගෙන නොයා යුතුය. එබඳු බලපත්‍රයක් නොමිලේ නිකුත් කළ යුතුය.

12. ආණ්ඩුවේ ඒජන්තගේ පූර්ව අනුමැතිය නොලබා කිසිවකු විසින් කඳවුරු ප්‍රදේශය ඇතුළත හෝ එකී ප්‍රදේශ සීමාවෙන් හැතැප්මක අර්ධ විෂ්කම්භය ඇතුළත වෙඩි පත්තු කිරීම හෝ ගිනි දැල්වීම හෝ නොකළ යුතුය.

13. ආණ්ඩුවේ ඒජන්තගේ පූර්ව අනුමැතිය නොලබා, කිසිවකු විසින් කඳවුරු ප්‍රදේශයේ ප්‍රධාන වීථිය හෝ වෙනත් වීථි හෝ ඇදා ගැනෙන අන්දමින් කුටියක් හෝ ගොඩනැගිල්ලක් ඉදි නොකළ යුතුය.

14. (i) ආණ්ඩුවේ ඒජන්ත විසින් හෝ ඔහුගේ අනුමැතිය ඇතිව හෝ සපයා දී ඇති ස්ථාන වල හැර අන් කිසිම ස්ථානයක කිසිවකු විසින් කඳවුරු ප්‍රදේශයෙහි කිසිම සතකු මස් පිණිස නොමැරිය යුතුය. එබඳු තැනකදී කිසියම් සතකු මරණ කවර කෙනෙකු වුවද, එහි පිරිසිදු බව ගැන වගකිව යුතුය. මැරීමට ඇති සතුන් නිරෝග බවටත් ඒ සතුන්ගේ මස් මිනිසුන්ගේ ආහාරයට සුදුසු බවටත් මහජන සෞඛ්‍ය නිලධාරි තැන විසින් සහතික කරනු ලැබීම පිණිස උන් සුවිසි පැයක් කොටු කොට තැබිය යුතුය.

(2) ආණ්ඩුවේ ඒජන්ත විසින් හෝ ඔහුගේ අනුමැතිය ඇතිව හෝ සලසන ලද තැනක හැර කඳවුරු ප්‍රදේශය තුළ අන් කිසිම තැනක කිසිවකු විසින් මස්, මාළු හෝ එළවළු නොවිකිණිය යුතුය. මිනිසුන්ගේ පාවිච්චියට නුසුදුසු වූ හෝ කල් තියා ගැනීම නැතහොත් අනිසි ලෙස ගබඩා කිරීම නිසා කිසි අන්දමකින් පරණ වූ හෝ මස්, මාළු හෝ එළවළු නොවිකිණිය යුතුය.

15. තලවිල ශාන්ත ආනා මංගල්‍යය සම්බන්ධයෙන් 1946 නොවැම්බර 8 වැනි දින අංක 9,626 දරණ ගැසට් පත්‍රයේද 1953 අගෝස්තු 28 වැනි දින අංක 10,853 දරණ ගැසට් පත්‍රයේද පළවූ රෙගුලාසි මෙයින් අවලංගු කෙරේ.

12–593

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### 1959 අංක 5 දරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1941 අංක 39 දරණ ණය සහනදයක ආඥාපනත

1959 අංක 5 දරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1941 අංක 39 දරණ ණය සහනදයක ආඥා පනත යටතේ පහත දක්වෙන උපලේඛනයේ අංක. 1 සහ 2 යන ශීර්ෂයන්හි දක්වෙන ණයකරුවන් හා ණයහිමියන් යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ණය සහනදයක මණ්ඩලය අදහස් කර ඇත.

මේ සඳහා ඒ ඒ ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණය පිළිබඳ විස්තර ප්‍රකාශයන් 1971 ජනවාරි 18 වෙනි දිනට පෙර මණ්ඩලය වෙත ඉදිරිපත් කරණ ලෙස ණයහිමියන්ට මෙයින් දන්වනු ලැබේ.

ඇම්. ඒ. අමරසිංහ,
ණය සහනදයක මණ්ඩලයේ ලේකම්.

1970 දෙසැම්බර් මස 8 වැනි දින,
කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ,
අංක. 33/1. "අම්බා". දරණ ස්ථානයේ පිහිටි
ණය සහනදයක මණ්ඩලයේ දී ය.

උපලේඛනය

| ඉල්ලුම්පත් අංක | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 23873 ... | සභාපති කන්දසාමි, මාවිඩ්ඩපුරම්, තෙල්ලපලෙයි ... ... | 1. සුබ්‍රමානියා කුරුක්කල්,<br>2. සුප්පු ලක්ෂමි, වන්නාර් පොන්නෙයි, යාපනය |
| 24102 ... | පුන්චිහේවගේ කරුණාවතී, 236, කිත්තම්පහුව, වැල්ලම්පිටිය ... | වින්සන් ද ලිවේරා, 423, කිත්තම්පහුව, වැල්ලම්පිටිය |
| 24103 ... | කළුබන්ඩා තෙන්නකෝන්, කන්දේගෙදර, කටුපොත ... | කහටපිටිකංකානමලාගේ ඇයිලින් නෝනා, රුදියගොඩ, කටුපොත |
| 24104 ... | රාජසේකරවඩුගේ ඇලිස් නෝනා, කේ. ඇම්. සෝමරත්න බාරේ, කප්පාගොඩ, මාවනැල්ල | 1. හකුරුසිංහදේවයලා දන්තුවා, කප්පාගොඩ, මාවනැල්ල<br>2. ඇස්ඇද්දුමේගෙදර දන්තුවා, කප්පාගොඩ, මාවනැල්ල<br>3. දෙඩියන්ටල රාජකරුණා දුක්ගන්නා, වලව්වේ ටිකිරිබණ්ඩා, ඩියඹලාපිටිය, මාවනැල්ල<br>4. ලිදාගාවත්තේගෙදර පියාතු හාමි, කප්පාගොඩ, මාවනැල්ල |
| 24107 ... | 1. ඉස්මායිල් මරික්කාර් සලයිලා උම්මා,<br>2. මොහොමඩ් හනිපා මොහමඩ් නසූර්දීන්<br>3. මොහමඩ් හනිපා කුරුය්,<br>4. මොහමඩ් හනිපා අමුදීන්,<br>අංක. 262, එගොඩඋයන, මොරටුව ... | මහමන්ධාඩිගේ සිරිල් ප්‍රනාන්දු, ඩියය් ගොඩනැගිල්ල, පානදුර |
| 24108 ... | 1. සුප්පයියා පෙරුමාල් සහ බිරිඳ, 2. මුත්තම්මා, මඩුවිල් උතුර, චාවාකච්චේරි | පිලිප්ගේ වැන්දඹු බිරිඳ ත්‍රේයම්මා, මඩුවිල් උතුර, චාවාකච්චේරි. |
| 24112 ... | ලොප්පුපිල්ලේ අමිර්තනාදර් ජෝෂප්, "අමිර්තාවිලා", මතගල් ... | සවරිමුත්තු අන්තෝනිපිල්ලේ, 14, 1 වෙනි හරස් විදිය, රෙක්ල මේෂන්, කරෙයියූර්, යාපනය |
| 24113 ... | ඇග්නස් එදිරිසිංහ, වතුකොලවත්ත, තලල්ල උතුර, කැකනදුර | දිල්ලිමුණි සිටින් ද සිල්වා, වාටාම, දෙවුන්දර |
| 24115 ... | දොන් හෙන්ද්‍රික් මදරසිංහ සිරිවර්ධන, කළුබෝවිටියන ගෙදර, වරල්ල | කංකානම්ගමගේ මේරිනෝනා, කුඩාදුදෙනිය, වරල්ල |
| 24116 ... | සින්නතම්බි මයිල්වාගනම්, ඇම්. තංගරාජා බාරේ, කොට්ඨාශ අංක. 3 කල්මුනේ | 1. මාරිකුට්ටි මරගාදම්, 2. ඇම්. සින්නතම්බි කනපතිපිල්ලෙ, කොට්ඨාශ අංක. 3, කල්මුනේ |
| 24117 ... | වෛද්‍ය සින්නයියාපිල්ලේ රාජේන්ද්‍රම්, 283, ආදුරුප්පු විදිය, කොළඹ | කාඩිනි තිස්ස විරසිංහ, 106/3, ජාවත්ත පාර, කොළඹ 7 |
| 24119 ... | ආර්. ඩී. දියෝනිස්, ගාලෙවත්ත, කඹුරාදෙනිය, දන්ඕවිට ... | 1. මොහොමමදු සාලි උම්මු රලිමා, 2. අහමඩ් ජෙලාල්දීන් සිත්ති බදූර් නියා, 3. අහමඩ් ජෙලාල්දීන් මොහමඩ් බස්රුල්හාෆි, 4. අහමඩ් ජෙලාල්දීන් මුහම්මිල්, 5. අහමඩ් ජෙලාල්දීන් සපියතුල් ලුත්පියා, 6. අහමඩ් ජෙලාල්දීන් මොහමඩ් නියාස්, 7. අහමඩ් ජෙලාල්දීන් මොහමඩ් යරුක්, පොතාවල, වේවැල් දෙනිය |
| 24120 ... | තේනන්දලුමුදියන්සේලාගේ අප්පුහාමි, ඉහල වීරකොඩියාන, 73ඒ, ඉහල වීරකොඩියාන, පනිරෙන්දව, මාදම්පේ | දසනායක මුදියන්සේලාගේ ඩිංගිරිමැණිකා, ඉහළවීරකොඩියාන, වීරකොඩියාන, දුම්මලසූරිය |
| 24121 ... | එච්. ඒ. ගුණතිලක, කහඹිලියාව, අලව්ව ... ... | ඒ. කේ. ප්‍රේමරත්න, ඕපාත, අලව්ව |
| 24123 ... | 1. ආරුමුගම් සුබ්‍රමානියම් සහ බිරිඳ, 2. මීනඩ්සි, ඒ. ඇස්. ඇස්. නඩරාජා බාරේ. අංක. 6, ප්‍රධාන පාර, යාපනය ... | කනගසුන්දරම් සිංගනායගම්, තෙල්ලිපලෙයි නැගෙනහිර, තෙල්ලිපලෙයි |
| 24124 ... | සින්නතම්බි වෙල්ලයියා, කොට්ඨාශ අංක 3, කෙරයිතිවු ... | කනපතිපිල්ලේ එලියතම්බි, කොට්ඨාශ අංක. 3, කරෙයිතිවු |
| 24127 ... | ඉලිප්පුලිගාලලාගේ රුබන්, හකුරුකුඹුර, මීරිගම ... ... | හොරතලිගේ පේමාවති, ඇලියාවලතැන්න, කොහිලගෙදර |
| 24128 ... | නාගලිංගම් කුමාරස්සාමි, කුම්ල්, පුලෝලි බටහිර, පොයින්ට් පෙද්‍රු | කදිරගාමර් තිවෙන්දිරා ගේ බිරිඳ රාජේස්වරි, අලි-ලාකම්, හිර්ලි හෝස්ටල් පාර, පුලෝලි බටහිර, පොයින්ට්පේද්‍රු |
| 24129 ... | බටරම් ප්‍රේමසිරි රත්නවීර, බණ්ඩාරනායක මාවත, වැල්ලක්ක, වැලිගම | ජෝන් කනංකේ සූරියආරච්චිලියනගේ, 215, බණ්ඩාරනායක මාවත, වැල්ලක්ක වැලිගම |
| 24131 ... | 1. නාගමුත්තු වෙල්ලයියා, 2. බිරිඳ කමලම්, 3. සින්නයියා සහ බිරිඳ, 4. කනගම්මා, 8/1, පන්නෙයිපාර, යාපනය | 1. ඇන්. බාලක්‍රිෂ්ණන්, 2. බිරිඳ සත්‍යබාමා, පොලිස් ස්ථානය අලස, දකුණු පටුමග, චුන්නාකම් |
| 24132 ... | කුමාරේසු කන්දයියා, වෝඩ් අංක 3 පුන්ගුඩුතිවු, බටහිර, පුන්ගුඩුතිවු | 1. අරුලම්පලම්ගේ බිරිඳ මන්කයටකරසි<br>2. පී. අරුලම්පාලම් වෝඩ් අංක 6 පුන්ගුඩුතිවු, බටහිර, පුන්ගුඩුතිවු |
| 24135 ... | උඩුගමවිදානගේ ඇලිස්, මැදගොඩැල්ල, ඇහැලාපේ, මාලිදූව, අකුරැස්ස | උඩුගමවිදානගේ ඇඩ්මන්, උඩුගමවිදානගේ අල්විස් භාරේ, උඩුගම නැගෙනහිර |
| 24136 ... | 1. වනුම්පුරගේ කිරියදා, 2. වනුම්පුරගේ හරමානිස්, 3. වනුම්පුරගේ පුරන්සිනා, මලවිට, හෝටිමුල්ල | පී. පී. වික්‍රමසිංහ, දමුනුපොල, මොරොන්තොට |
| 24137 ... | උපාලි ෆ්‍රැන්සිස් ගුණරත්න, 15/17, රිච්මන්හිල් පාර, ගාල්ල ... | කෝට්ටෙගොඩ කංකානම්ගේ විජේපාල, "මරෙයිකඩේ", මරේ වතුයාය, මස්කෙලිය |
| 24138 ... | පේරාමුඩ ගල්ලන්රාල්ලාගේ පුංචිබණ්ඩා, තැඹිලිපිටිය, ලාහුපනේ | අරුක්මුල්ලේ මාරබෙලාගේ අබන්ටියා, අරුක්මුල්ල, ලාහුපනේ |
| 24140 ... | අහමදුලෙබ්බෙ මොහමඩ් අබ්දුල්ලා, 21, හිරිඹුර පාර, ගාල්ල ... | ගාල්ලේ හේවාගේ රිචර්ඩ්, මැද කිඹිය, අක්මීමන |
| 24141 ... | සුබ්‍රමානියම් රත්නසභාපති, දෙවෙනි හරස් විදිය, පොයින්ට්පේද්‍රු | සින්නයියා මානික්කම් තුරෙයි සිංහම්, පන්නෙයි කඩ්ඩෙයි, පුලෝලි නැගෙනහිර, පොයින්ට් පේද්‍රු |
| 24142 ... | සුබ්‍රමානියම් රත්නසභාපති, දෙවෙනි හරස් විදිය, පොයින්ට්පේද්‍රු ... | සින්නයියා මානික්කම් කන්දසාමි, පන්නෙයි කඩෙයි, පුලෝලි නැගෙනහිර, පොයින්ට් පේද්‍රු |
| 24145 ... | දොන් පොඩිඅප්පුහාමි රණසිංහ, අංක. 7, මහ විද්‍යාල ඉදිරිපිට, අම්පාර | ඇම්. ඇම්. මුයිම්, යූ. එච්. 22, මහ විද්‍යාලය ඉදිරිපිට, අම්පාර |
| 24171 ... | ජාලත්ගේ මර්තේනිස්, 289, ප්‍රධාන පාර, දෙනියාය ... | හේවාගමගේ පේමවති, බටයාය, දෙනියාය |
| 24201 ... | රන්පටිදේවගේ සයිමන්, මොහොට්ටිමුල්ල, දන්කොටුව ... | පේදිරික් ජයසේකර, බූදලයේ භාරකරු : දියසේන ජයසේකර, මොහොට්ටිමුල්ල, දන්කොටුව |
| 24210 ... | ඇල්පිටියේ මුහම්දිරමලාගෙදර හබීබු, ලෙබ්බෙ මොහමදු හනිපා, දස්නර, මුරුතගහමුල | එස්. ඇම්. ආරියවන්ස්, ගොඩමුන්නෑ, කපුලියද්ද |
| 24287 ... | ආරුමුගම් රත්නම්, අංක. 4, පලවෙනි පටුමග, බ්‍රවුන් පාර, යාපනය ... | 1. නල්ලතම්බි වෛදනායකගම්, වන්නාර්පොන්නෙයි නැගෙනහිර, යාපනය<br>2. ඇස්. කේ. තුරෙයිසිංහම් සහ බිරිඳ වෛදවල්ලි, 41, නුවර පාර, යාපනය<br>3. ආරුමුගම්ගේ වැන්දඹුව, සෙල්ලම්මා, සිවප්‍රගාසම් පාර, වන්නාර්පන්නෙයි. |
| 24340 ... | අහමඩ් ලෙබ්බෙ අබ්දුල් හමීඩ්, බමුණාවල, කුරුණෑගල (මියගොස්) ඒ. රහිලා උම්මා | මුපෙහේවගේ ජයතිස්ස, නැෂනල් ස්ටෝර්ස්, බසාර් විදිය කුරුණෑගල |
| 24386 ... | ගජනායක මුදලිගේ පියසේන, මොහොට්ටිමුල්ල, දන්කොටුව ... | පේද්‍රික් ජයසේකර (මියගොස්), බූදලයේ බලකරු : ඩී. ජයසේකර, මොහොට්ටිමුල්ල, දන්කොටුව |
| 24420 ... | ඊ. ඇම්. විජේකෝන් බණ්ඩා, මීපිටිය, දෙඩන්ගස්ලන්ද ... | 1. පාක්කියවති බාලසුබ්‍රමානියම්, 2. පරමේශ්වරි පරමසෝති, කංගාඩෙයි, කරෙයිනගාර් |

| ඉල්ලුම්පත් අංක | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 24427 | පලවින්නගේ ජොහානා හාමි, පොරපොලගෙවත්ත, වැලිහිටිය, දික්වැල්ල | බෝතුරාගොඩ කංකානම්ගේ දයින්අප්පු, වැලිහිටිය, දික්වැල්ල |
| 24447 | රොබට් ගෝමිස් අබේසිංහ ජයවර්ධන, පටිකාර වලව්ව, කඩවත | පී. ආර්. තාඹුගල, (මියගොස්) පී. ඩී. තාඹුගල, මනික්කාව, හින්ගල |
| 24455 | බියන්විලගේ පීටර්පෝල් පෙරේරා, දන්පැලිය, වැලිගම්පිටිය, ජා ඇල | අන්තෝනිගේ මේරි නෝනා, ජී. පිච්චා නාඩාර් බාරේ, වැලිගම්පිටිය වැවල, කොන්වන්ට් පාර, වැලිගම්පිටිය. ජාඇල |
| 24530 | දිසානායක තලංගම අප්පුහාමිලාගේ සයිමන් දිසානායක, දෙරණගොඩ, උඩුගම්පොල | සෝමාවතී දිසානායක, දෙරණගොඩ, උඩුගම්පල |
| 24542 | ඩබ්. බී. ඇස්. ප්‍රනාන්දු, අංක 5, සුබෝධාරාම පාර, දෙහිවල | බී. ඒ. අබයරත්න, අංක. 5/7, පොලිස්පාක් ටෙරස්, කොළඹ 5 |
| 23549 | 1. බී. ආර්. බබී, 2. ඇල්. එච්. ගුණවතී, අංක. 187, ඇහැලගස්හින්න, පූජාපිටිය | ධනපාල මුදියන්සේලාගේ බණ්ඩාරමැණිකේ, පල්ලේගම්පහ, හුරිකඩුව |
| 24626 | පත්තිනියාදේව රත්නාවතී, මහගොඩ, වතුගෙදර ... | 1. විජේමුණි සෝමපාල මැන්ඩිස්. දන්ගහවිල, වතුගෙදර<br>2. කළුවාදේව ජේන් නෝනා, මහගොඩ, වතුගෙදර |
| 24139 | කේ. බී. පීටර් සිල්වා, පරණකඩේ, වැලිගම ... | එච්. ජී. ධර්මසේන, වට්ටන්ගොඩ බෙහෙත් ශාලාව, සාප්පු කඩේ, වැලිගම |
| 24215 | රීයසරාවරි රොසලින්, ආඳාදෙල, වතුගෙදර ... | රුවන්පුර ලීලා ජයවතී මැන්දිස්, ආඳාදෙල, වතුගෙදර |
| 24458 | ගට්රූඩ් පවලමනි සේවියර්. කොට්ඨාශ අංක. 2, කල්මුනෙ | මේරි ආචියමලර් එස්ටෝගු පිල්ලේ, කොට්ඨාශ අංක. 2, උඩයාර් පාර, කල්මුනේ |
| 24580 | එඩ්වර්ඩ් රෝලන්ඩ් බස්නායක, වරාගොඩ, කැළණිය | එච්. ඇම්. ඒ. වී. ඇස්. දිසානායක, වතුපිටිවල<br>පැවරුඅය : ඇම්. තෝමස් අප්පුහාමි, හැඳල |
| 24451 | ඔලුස්සාපතිරන්නැහැලාගේ පුංචිප්පුහාමි, නාරන්ගමුව, ගිරිඋල්ල | ඔලුස්සාපතිරන්නැහැලාගේ ගුණරත්න, තැන්නාගම, අඹේපුස්ස |
| 24459 | කදිරවේලු සිවසම්බු, කුපිලාන්, චුන්නාකම්, ... | නල්ලම්මා (වයිරමුත්තුගේ වැන්දඹුව) කුප්ලාන්, චුන්නාකම් |

12—655

## කොළඹ දිස්ත්‍රික්කයේ 1969–70 වර්ෂයේ ගවයින් හණ නිවරණය කිරීමේ වැඩ සටහන

1962 නොවැම්බර් මස 29 වන දින අංක 13,406 (සිංහල භාෂාවෙනි) දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ගවයින් හණ නිවරණය කිරීම පිළිබඳව නීති මාලාවේ 12(III) වගන්තිය අනුව කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිළධාරී කොට්ඨාශයේ 1969/70 ගවයින් හණ නිවරණය. කිරීමේ වැඩ සටහන් මහජනයාගේ දැනගැනීම පිණිස මෙහි පහත ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඩ. වී. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 නොවැම්බර් මස 7 වන දින,
කොළඹ දිසාපති කාර්යාලයයේ දීය.

| ග්‍රා.සේ. අංකය හා කොට්ඨාශය | ස්ථානය | දිනය |
|---|---|---|
| 425—කනම්පැල්ල | ටී. පී. පී. ජයතිලක මහතාට අයිති ගොඩැල්ල වත්ත නමැති ඉඩම | 70.12. 1 |
| 425—කනම්පැල්ල | ඩී. ඇස්. රණසිංහ මහතාට අයිති කිතුලමූකලාන නමැති ඉඩම | 70.12. 2 |
| 433—බොල්ලතාව | ග්‍රාමසේවක කායර්‍යාලය පිහිටි ඉඩම | 70.12. 1 සහ 2 |
| 441—මාබුල-කහහේන | ගුණවතී ඉද්දමල්ගොඩ මහත්මියට අයිති කොස්ගහවත්ත නමැති ඉඩම | 70.12. 1 සහ 2 |
| 438—නිරිපොල | ග්‍රාමසේවක කායර්‍යාලය පිහිටි ඉඩම | 70.12. 1 සහ 2 |
| 444—තුන්නාන | ඩී. පී. සච්නේරිස් මහතාට අයිති රන්හිකැලේ නමැති ඉඩම | 70.12. 1 සහ 2 |
| 462—ලියන්වල | කේ. ඒ. ඩී. කොරනේලියා ගුණසේකර මහතාට අයිති කහටගහලන්ද නමැති ඉඩම | 70.12. 1 |
| 462—පෝරේගෙදර | විජේතුංගගේ හේරිස් අප්පුහාමිට අයිති ඉහලවත්ත නමැති ඉඩම | 70.12. 2 |
| 426—තාවල්ගොඩ | ටී. ඩී. තෝමස් සිංඤෝ මහතාට අයිති අකරවිටලන්ද නමැති ඉඩම | 70.12. 3 සහ 4 |
| 434—අකරවිට | ටී. ඒ. ඩී. ධනපාල ගුණරත්න ජයතිලක මහතාට අයිති කුංඅඳහේන නාමැති ඉඩම | 70.12. 3 සහ 4 |
| 442—වැලිකන්න | ආර්. ඩී. එළාරිස් අප්පුහාමිට අයිති මිල්ලගහලන්ද නමැති ඉඩම | 70.12. 3 සහ 4 |
| 439—දිද්දෙනිය | ග්‍රාමසේවක කායර්‍යාලය පිහිටි ඉඩම | 70.12. 3 සහ 4 |
| 444ඒ—මාවතගම | ඩබ්ලිව්. ඩී. සේතන් මහතාට අයිති දෙල්ගහවත්ත නමැති ඉඩම | 70.12. 3 සහ 4 |
| 461—පාදුක්ක | ඇම්. ඩී. පෙරේරා මහතාට අයිති මහගම්මැද්ද නමැති ඉඩම | 70.12. 3 |
| 461—උඩුමුල්ල | ඇල්. ඩී. සමරනායක මහත්මියට අයිති කහටගහවත්ත නමැති ඉඩම | 70.12. 4 |
| 427—කොස්ගම පහළ | ඇස්. ඊ. විජේසුන්දර මහතාට අයිති හෙට්ටිකොටුව වත්ත නමැති ඉඩම | 70.12. 6 සහ 7 |
| 435—කහටපිටිය | ග්‍රාමසේවක කායර්‍යාලය පිහිටි ඉඩම | 70.12. 6 සහ 7 |
| 442ඒ—පංඥගුල | ග්‍රාමසේවක කායර්‍යාලය පිහිටි ඉඩම | 70.12. 6 සහ 7 |
| 443—හංවැල්ල ඉහළ | ඊ. ඩබ්ලිව්. ජයසිංහ මහතාට අයිති පහන්ගම මහයායවත්ත අසල | 70.12. 6 සහ 7 |
| 452—ගලගෙදර | කියු. ඩී. පත්මපෙරුම මහතාට අයිති දෙල්ගහවත්ත (නො.) මැටියාගහවත්ත නමැති ඉඩම | 70.12. 6 සහ 7 |
| 460—අරුක්වත්ත | ඇලෝසියස් පත්මපෙරුම මහතාට අයිති මෙරගහලන්ද නමැති ඉඩම | 70.12. 6 සහ 7 |
| 428—කොස්ගම ඉහළ | ග්‍රාමසේවක කායර්‍යාලය පිහිටි ඉඩම | 70.12. 8 සහ 9 |
| 436—කලුවග්ගල | ඊ. ඒ. ද සිල්වා මහතාට අයිති ශාලාව වතුයායේ කලුවග්ගල සමුපකාරය අසල | 70.12. 8 සහ 9 |
| 458—වග ... | ඇම්. ඩී. තෝමිස් අප්පුහාමිට අයිති වන්ගුවේ ඉඩම | 70.12. 8 සහ 9 |
| 445—හංවැල්ල පහළ | ග්‍රාමසේවක කායර්‍යාලය පිහිටි ඉඩම | 70.12. 8 සහ 9 |
| වටරක | එච්. ඇල්බින් පෙරේරා මහතාට අයිති කලවිටිගොඩ වත්ත | 70.12. 8 |
| 448—ඕවිටිගම ... | ඕවිටිගම පිහිටි මාර්කට් භූමිය | 70.12. 9 |
| 455—වේරගල | ප්‍රසිද්ධ සුසාන භූමිය අසල | 70.12. 8 |
| 455—මාහිංගල | ජේ. ඩී. අභාරත්න මහතාට අයිති කැටකැලගහවත්ත නමැති ඉඩම | 70.12. 9 |
| 429—ඇස්වත්ත... | ග්‍රාමසේවක කායර්‍යාලය පිහිටි ඉඩම | 70.12.10 සහ 11 |
| 440—නෙළුවත්තුඩුව | එච්. ඩී. සුගතන් සිංඤෝ මහතාට අයිති ඇල්ලවත්ත නමැති ඉඩම | 70.12.10 |
| 440—බ්‍රැන්ඩිගම්පල | පී. ඩී. පේදුරු අප්පුහාමි මහතාට අයිති දෙල්ගහවත්ත නමැති ඉඩම | 70.12.11 |
| 456—පින්නවල... | කේ. පී. සිරිසේන මහතාට අයිති කහටගහවත්ත | 70.12.10 සහ 11 |
| 446—ආටිගල ... | ඩී. සූරියප්පෙරුම මහතාට අයිති විලවුඩවත්ත | 70.12.10 සහ 11 |
| 446ඒ—දම්පේ ... | ආර්. ඩී. ජේමිස් සිංඤෝ මහතාට අයිති අඹගහවත්ත නමැති ඉඩම | 70.12.10 සහ 11 |
| 466—මීරියගල්ල | ග්‍රාම සංවර්ධන ශාලාව අසල | 70.12.10 සහ 11 |
| 436—පූවක්පිටිය | එගොඩගම් ගම්මැද්දවත්ත නමැති ඉඩම | 70.12.13 සහ 14 |
| 437—මාවල්ගම | ග්‍රාම සේවක කායර්‍යාලය පිහිටි ඉඩම | 70.12.13 සහ 14 |
| 453—පිටුම්පෙ ... | එච්. ඩී. ජොරනිස් සහ එච්. ඩී. දියෝනිස් මහතාට අයිති දෙල්ගහවත්ත නමැති ඉඩම | 70.12.13 සහ 14 |

| ග්‍රා. සේ. අංකය හා කොට්ඨාශය | ස්ථානය | දිනය |
|---|---|---|
| 451—ජල්තර | ග්‍රාමසේවක කාර්‍යාලය පිහිටි ඉඩම | 70.12.13 සහ 14 |
| 465—කුරුගල | වල්පොලගේ ලියෝරිස් මහතාට අයිති එනේතොට ලන්ද නමැති ඉඩම | 70.12.13 සහ 14 |
| 467—මලගල | ඩී. ඒ. බාලසූරිය මහතාට අයිති ගොඩඋඩයාවත්ත නමැති ඉඩම | 70.12.13 සහ 14 |
| 432—අවිස්සාවේල්ල | ග්‍රාමසේවක කාර්‍යාලය පිහිටි ඉඩම | 70.12.15 සහ 16 |
| 430—කඩුගොඩ | ග්‍රාමසේවක කාර්‍යාලය පිහිටි ඉඩම | 70.12.15 සහ 16 |
| 454—උග්ගල්ල | ග්‍රාමසේවක කාර්‍යාලය පිහිටි ඉඩම | 70.12.15 සහ 16 |
| 450—බටවල | කේ. හරමානිස් සිංඤෝ මහතාට අයිති මීගහවත්ත (නො.) කෝන්ගහවත්ත නමැති ඉඩම | 70.12.15 සහ 16 |
| 464—හොරගල | ග්‍රාමසේවක කාර්‍යාලය පිහිටි ඉඩම | 70.12.15 සහ 16 |
| 468—යටවතුර | පී. චාර්ලිස් සිංඤෝ මහතාට අයිති කැන්නපිටවත්ත නමැති ඉඩම | 70.12.15 සහ 16 |
| 459—බෝපෙ | ආර්. ඒ. මෙතියස් සිංඤෝ මහතාට අයිති කහටගහවත්ත නමැති ඉඩම | 70.12.17 සහ 18 |
| 447—මීගොඩ | ඇම්. කිරිනේලිස් මහතාට අයිති දපන්ගහලන්ද නමැති ඉඩම | 70.12.17 සහ 18 |
| 463—මාදුලාව | දෙන් සයිමන් වැලිකල මහතාට අයිති මීල්ලගහවත්ත නමැති ඉඩම | 70.12.17 සහ 18 |
| 458—උඩගම | එච්. සර්නේලිස් මහතාට අයිති මහන්තගේවත්ත නමැති ඉඩම | 70.12.17 සහ 18 |
| කුඩගම | කුඩගම ග්‍රාමසේවක කාර්‍යාලය පිහිටි ඉඩම | 70.12.17 සහ 18 |

12–591

---

ණය අංක 2125

## ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව

### 402 අධිකාරය වන කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥාපනතේ 74 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීමයි

ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (1956 ලංකා නීති ප්‍රඥප්තියේ ප්‍රතිශෝධිත සංස්කරණයේ 402 වැනි අධිකාරය වූ) ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥාපනතේ 71 වන වගන්තිය යටතේ සම්මත කරන ලදුව අංක 14,901 හා 1970 මැයි 22 දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහිද 1970 සැප්තැම්බර් 21 වැනි දින 'සිලෝන් ඩේලි මිරර්' පත්‍රයෙහිද පළවූ තීරණය අනුව, පූර්වෝක්ත ආඥාපනතේ 78 වැනි වගන්තිය ප්‍රකාර, විකුණන අවස්ථාවේදී අයවීමට තිබෙන මුළු මුදලේ ශේෂය, පොලිය, විකුණුම් වියදම් සහ අවශේෂ ගාස්තුද වශයෙන් අයකර ගැනීමට ඇති සියළුම මුදල් අයකර ගැනීම පිණිස, උතුරු පලාතේ, වව්නියා දිස්ත්‍රික්කයේ, මනිතැන්නෙ පත්තු කෝරලේ, මුල්ලියාවලෙයි පත්තුවේ මුල්ලියාවලෙයි ගමේ පිහිටි, අලඩිසිල්කඩු නමැති ඉඩමේ ලොට් '1ඒ' දරණ කැබැල්ලට මායිම්: උතුරට සහ දකුණට මෙම ඉඩමේ ඉතිරි කොටස වන ලොට් 1 දරණ තාම්බු සෝමපිල්ලෙගේ නීත්‍යානුකූල උරුමක්කාරයින්ට අයත් ඉඩමද, නැගෙනහිරට සහ බටහිරට පාරද යන මෙකී මායිම් තුළ, බලයලත් වෙන්දේසිකාර. පී. ඒ. සේනාදිරාජා විසින් සකස් කරන ලද අංක 1 සහ 1959 ජූලි 10 වෙනි දින දරණ ප්ලෑන ප්‍රකාර අක්කර හයකින් (අ. 6, රූ. 0, ප. 0) යුත්, වව්නියා දිස්ත්‍රික් ඉඩම් කාර්යාලයේ ඒ 22/281 හි ලියාපදිංචි කර ඇති ඉඩම යාපනයේ, හතරවන හරස් පාරේ අංක 24 දරණ ස්ථානයේ පදිංචි බලයලත් වෙන්දේසිකාර ඇස්. රත්නසබාපති මහතා විසින් 1971 ජනවාරි 24 වැනි දින පෙරවරු 10 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

හි. සැ. ජෝ. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

1970 නොවැම්බර් 14 වෙනි දින,
කොළඹ 3, ගාලු පාරේ අංක 292 දරණ ස්ථානයේදීය.

12-679

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක **මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

සැ. යු.—**මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අය විය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.**

### උපලේඛනය

**1970**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් | ... | 70.12. 4 සිකුරාද | ... | 70.11.27 සිකුරාද | දහවල් | 12.00 |
| | | 70.12.11 සිකුරාද | ... | 70.12. 4 සිකුරාද | දහවල් | 12.00 |
| | | 70.12.18 සිකුරාද | ... | 70.12.10 බ්‍රහස්පතින්ද | ප. ව. | 3.30 |
| | | 70.12.24 බ්‍රහස්පතින්ද | ... | 70.12.17 බ්‍රහස්පතින්ද | ප. ව. | 3.30 |
| | | 70.12.31 බ්‍රහස්පතින්ද | ... | 70.12.24 බ්‍රහස්පතින්ද | ප. ව. | 3.30 |

**1971**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 71. 1. 8 සිකුරාද | ... | 70.12.31 බ්‍රහස්පතින්ද | ප. ව. | 3.30 |
| | | 71. 1.15 සිකුරාද | ... | 71. 1. 8 සිකුරාද | ප. ව. | 3.30 |
| | | 71. 1.22 සිකුරාද | ... | 71. 1.15 සිකුරාද | ප. ව. | 3.30 |
| | | 71. 1.29 සිකුරාද | ... | 71. 1.22 සිකුරාද | ප. ව. | 3.30 |
| පෙබරවාරි | ... | 71. 2. 5 සිකුරාද | ... | 71. 1.29 සිකුරාද | ප. ව. | 3.30 |
| | | 71. 2.12 සිකුරාද | ... | 71. 2. 3 බදාදා | ප. ව. | 3.30 |
| | | 71. 2.19 සිකුරාද | ... | 71. 2.12 සිකුරාද | ප. ව. | 3.30 |
| | | 71. 2.26 සිකුරාද | ... | 71. 2.19 සිකුරාද | ප. ව. | 3.30 |
| මාර්තු | ... | 71. 3. 5 සිකුරාද | ... | 71. 2.26 සිකුරාද | ප. ව. | 3.30 |
| | | 71. 3.12 සිකුරාද | ... | 71. 3. 3 බදාදා | දහවල් | 12.00 |
| | | 71. 3.19 සිකුරාද | ... | 71. 3.10 බදාදා | දහවල් | 12.00 |
| | | 71. 3.26 සිකුරාද | ... | 71. 3.17 බදාදා | දහවල් | 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 දෙසැම්බර් 18 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයයි